## 466 මල් මල් ලොවකට

මල් මල් ලොවකට දෑස් යොමාගෙන
දහසක් පැතුමන් හද පුරවා
සමිඳුන් හා අතිනත ගෙන යනවිට
මංගල ආසිරි රුව්දේවා

පැතු පැතුම් අප ලැබුවේ
ඔබෙ යහපත් කම නිසා පියේ
ඉටු කළ මැන එලෙසින් සමිඳේ
සැම යහපත් පැතුමන් ම අපේ

ජීවිත ගමනේ අරුත සොයාගෙන
සතුටින් සුවයෙන් සිතහ සලා
සමිඳුන් හා එක්වී නිති විසුමට
ආසිරි මල් වැසි නිති ලැබෙවා

පෙම් පිරි හැඟුමින් හද හද ලංකර
තිර පැතුමින් දෙනුවන් දල්වා
සමිඳුන් මහිමය බෙදනට යන විට
ජය මංගල ගී රුව්දේවා